ජීව හෝඩිය



පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය



LIBRARY
Ministry of Environment

ජීව හෝඩිය

අධීක්ෂණය
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.

උපදේශකත්වය
ජාතික අධ්‍යාපන අයතනය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
'ජීව හෝඩිය' පිළියෙල කිරීමේ කමිටුව.

සම්බන්ධීකරණය හා සැකසුම
වනජීවී හා පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය. (WEIC)

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය
අංක 104, 'පරිසර පියස'
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල.

ශ්‍රී ලංකාවේ පරිසර වැඩසටහන් සඳහා වූ ආයතනික ශක්තීන් වර්ධනය කිරීමේ සහ
හැකියාවන් ගොඩනැගීමේ නෙදර්ලන්ත ව්‍යාපෘතියේ අනුග්‍රහයෙනි.

LIBRARY
Ministry of Environment

ජීව හෝඩිය
ප්‍රථම මුද්‍රණය - 2005

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය
අංක **104**, 'පරිසර පියස', රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

වනජීවී හා පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය (WEIC)
අංක **491**, කොට්ටාව, පන්නිපිටිය.

ISBN 955 - 9120 - 38 - 7

කවරය :
පියල් උදය සමරවීර

පරිගණක පිටු සැකසුම :
සෙනරත් ධර්මතිලක (WEIC)

ඡායාරූප :
දුමින්ද සංජීව බාලසූරිය
නයනක රන්වැල්ල (ඈයාගේ ඡායාරූපය)
පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

චිත්‍ර :
සෙනරත් ධර්මතිලක
තුසිත ප්‍රේමරත්න (අම්මාගේ සිතුවම)

මුද්‍රණය :
විමුක්ති ප්‍රින්ට් ඇන්ඩ් ග්‍රැෆික් සිස්ටම්ස්
බත්තරමුල්ල.

හැඳින්වීම

දශක තුන හතරකට පෙර මෙරට බොහෝමයක් දරුවන් බහ තෝරන අවදියේ සිට විවිධ පරිසර පද්ධති හා එහි වෙසෙන සතුන් මෙන්ම දැකගත හැකි ශාක තුළින් ග්‍රහණය කරගත් ශ්‍රව්‍ය - දෘශ්‍ය අත්දැකීම් තුළින් පියවරෙන් පියවර තම දැනුම් සම්භාරය ගොඩනගා ගන්නා ලදී.

නැකතට අකුරු කියවීමේ සිට විවිධ අක්ෂර හඬ ඉහත කී පරිසර පද්ධති හා ඒවායේ දක්නට ලැබෙන ජීවීන්ගෙන් ලබාගත් ශ්‍රව්‍ය - දෘශ්‍ය සංවේදීතාවන්ගෙන් මෙන්ම අව්ව, වැස්ස, හිරු සඳු නැගීම බැසීම, ආදී ස්වාභාවික සංසිද්ධීන්ගෙන් හොඳින් තේරුම් ගන්නා ලදී.

මෙසේ සජීවී පරිසරය තුළින් ලබාගත් අත්දැකීම් සම්භාරය තුළින් තේරුම්ගත් අක්ෂර හඬ මත ගොඩනැගුණු අධ්‍යාපනය තුළ සංරක්ෂණ සංකල්පය නිරායාසයෙන් ම පැලපදියම් වනු ඇත.

මෙවන් සිසුන්ගෙන් බිහිවුණු පුරවැසියන් තුළ නිර්මාණය වූ පරිසර සංවේදීතාව ඔහුගේ විෂයානුබද්ධ දැනුමට වඩා ජන සමාජයේ යහපත් පුරවැසියකු වීමට මහත් උපකාරයක් වී ඇත.

වර්තමානයේ සිදුවෙමින් පවතින ශීඝ්‍ර නාගරීකරණය තුළින් ස්වාභාවික පරිසර පදධති මෙරට වැසියන්ගෙන් ඈත්වෙමින් පවතී.

දරුවන්ට දක්නට ලැබෙන සතුන් සහ ගස්කොළන් ප්‍රමාණය අවම මට්ටමක පවතී. විවිධත්වයෙන් තොර පරිසරයක දරුවන් සිරකර තැබීමෙන් ද අක්ෂර හඬ තේරුම්ගැනීම සඳහා පරිසරයෙන් ලැබෙන පිටුවහල අවම මට්ටමක පවතින බැවින් ද දරුවාට විවිධත්වය පිළිබඳ සංකල්පය වැටහීම සිදු නොවේ.

මෙම ගැටලුව මගහැරවීම පිණිස පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ පෞව විවිධත්ව ලේකම් කාර්යාලය ජීවීන්ගේ විවිධත්වය ඇතුළත් පරිසර විවිධත්වය තුළින් දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනයේදී මූලික අක්ෂර හඬ පහදා දීම සඳහා 'ජීව හෝඩිය' නිර්මාණය කරන ලදී.

ජාතික අධ්‍යාපන ආයතනයේ සහ වනජීවී හා පාරිසරික තොරතුරු මාධ්‍යස්ථානයේ පූර්ණ සහයෝගය මත පිළියෙල කළ මෙම 'ජීව හෝඩිය' තුළින් අප අවට පරිසර පද්ධති, සතුන් හා ශාක විශාල සංඛ්‍යාවක් ඇති බවත් තම අක්ෂර හඬ අධ්‍යයනයට සමගාමීව දරුවන්ට අවබෝධ වීම විශේෂ කරුණකි.

මෙමගින් දරුවා තුළින් ගොඩනැගෙන අනාගත පුරවැසියා සංරක්ෂණයට යොමුවූ පරිසර සංවේදී පුද්ගලයකු බවට පත්කිරීම සඳහා කිසියම් හෝ මෙහෙයක් ඉටුකිරීමට බලාපොරොත්තු වේ.

'ජීව හෝඩිය' මගින් අවට පරිසරය පිළිබඳ වැටහීමක් ජනිත කිරීමට රූප මාධ්‍යය භාවිත කරයි. 'ජීව හෝඩිය' යොදාගන්නා සමහර රූප සටහන් වටහාගැනීමේ පහසුව සඳහා එයට අදාළව සූචියක්ද පිළියෙල කර එය මෙම ග්‍රන්ථයට අඩංගුකර තිබේ.

'ජීව හෝඩිය' සිංහල හෝඩියේ සෑම අක්ෂරයකටම ගැළපෙන අයුරින් ශාකයක්, සත්ත්වයෙක් සහ පරිසර පද්ධතියක් ප්‍රාථමික ශ්‍රේණිවල දූ දරුවන්ට හඳුන්වා දෙමින් සාම්ප්‍රදායික හෝඩි පොතකින් බැහැරව ප්‍රාථමික අධ්‍යාපනය නව මගකට යොමු කිරීමට ගත් උත්සාහයකි.

අද දවසේ පරිසර සංරක්ෂණය අනාගත ආයෝජනයකි. එය අප සැමගේම වගකීමකි.

පිවිසුම

මිනිසාත් ඔහු අවට වටපිටාවේ සිටින සතා සීපාවාත් ගස් කොළනුත් අතර ඇත්තේ සුවිශේෂීය සබඳතාවකි. කාලාන්තරයක් තිස්සේ පැවැති සරල ජීවන රටාව තුළ කෑපී පෙනෙන ම සාධකයක් වන්නේ එය පරිසරයේ සමතුලිතතාව රකිමින් පරිසරයෙන් ලබාගත හැකි ප්‍රයෝජන අත්කර ගැනීමයි.

වර්තමාන සංකීර්ණ සමාජය තුළ මිනිසා සහ පරිසරය අතර පවතින සබැඳියාව බිඳී ගොස් සමස්ත පරිසරය පිළිබඳ යහපත් ආකල්ප ජනිත කරගනිමින් එය සංරක්ෂණයට කටයුතු කිරීම අත්‍යවශ්‍ය කාලීන අවශ්‍යතාවකි.

අපගේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පරිසරය පිළිබඳ වැඩි අවධානයක් යොමුව පවතින අතර විෂය නිර්දේශයන් තුළ සමස්ථයක් වශයෙන් පරිසරයේ විවිධ අංශයන් විමසුමට ලක් කරයි.

ජෛව විවිධත්වය අධික ව සාන්ද්‍ර වූ රටක් වශයෙන් ශ්‍රී ලංකාව ජගත් මට්ටමින් ප්‍රමුඛත්වයෙහිලා සැලකේ. ලොව ජෛව විවිධත්වය උණුසුම් කලාප 34 අතරට ගැනෙන අප රට ජෛව විවිධත්ව සම්මුතියේ දී පාර්ශව කරුවකු ලෙස කටයුතු කරයි.

ජෛව විවිධත්ව සංරක්ෂණය මගින් සමස්ත ජීවී ප්‍රජාවගේ ම පැවැත්ම තහවුරු කරන අතර එමගින් පරිසරයේ සමතුලිතතාව නිසි පරිදි පවත්වාගනී.

ජෛව විවිධත්ව සම්මුතියේ 12 සහ 13 වගන්තීන් අනුව එහි පාර්ශව කරුවන් ජෛව විවිධත්වය පිළිබඳ පර්යේෂණ, පුහුණු සහ මහජනතාව සඳහා ජෛව විවිධත්වය පිළිබඳ අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීමට වගකීම් දරයි.

ජෛව විවිධත්ව පිළිබඳව ප්‍රාථමික ශ්‍රේණි සිසු දරුවන් අරභයා පිළියෙල කළ මෙම 'ජීව හෝඩිය' උක්ත වගකීම වඩා අර්ථවත් ව හා දිගුකාලීන ආයෝජනයක් ලෙස ක්‍රියාවට නැංවීමක් ලෙස මම දකිමි.

ජෛව විවිධත්වය වැනි සංකීර්ණ විෂයක් වඩාත් සරල ව සහ ළමා මනසට ගෝචර වන පරිදි ඒකරාශී කර ජෛව විවිධත්වයේ මට්ටම් ළමා සිතට හුරු පුරුදු උදාහරණ මගින් විග්‍රහ කිරීම මෙම 'ජීව හෝඩියේ' විශේෂත්වයක් වන අතර මෙය නිසි පරිදි භාවිත කර අප පරිසරයේ අනාගත භාරකාර පරම්පරාවට ජෛව විවිධත්වයේ වැදගත්කම පිළිබඳ පණිවුඩය සම්ප්‍රේෂණය කරන මෙන් හිතාදර දෙමාපියන්ගෙනුත් ගුරු භවතුන්ගෙනුත් මා ඉල්ලමි.

තව දුරටත් ජෛව විවිධත්වයේ අගය මැනවින් වටහාගෙන එමගින් පරිසරයට ඇලුම් කරන ජාතියක් වශයෙන් සහ ජෛව විවිධත්වයෙන් සපිරි දේශයක් වශයෙන් අනාගතය ජයගන්නට 'ජීව හෝඩිය' පරිශීලනය කරන සමස්ත සිසු පරපුරට හැකිවේවායි මා ප්‍රාර්ථනා කරමි.

පී.එම්. ලීලාරත්න
ලේකම්
පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

ස්තූතිය

'ජීව හෝඩිය' පෙව විවිධත්වයේ අසිරියත් එහි වැදගත්කමත් ඉතාමත් සරල ලෙසින් සහ ආකර්ෂණීය ලෙසින් ළමා මනසට යොමුකිරීමට ගත් උත්සාහයකි.

ළමා මනස ඉලක්ක කරමින් ග්‍රන්ථ සම්පාදනයට අතශයින්ම වගකීම් සහිත දුෂ්කර කටයුත්තකි. පෙව විවිධත්වය පිළිබඳ අවබෝධය ළමා අවදියේ සිටම ළමා මනසට ගෝචරවන පරිදි හෝඩි පොතක ස්වරූපයෙන් සැකසීම ප්‍රශංසනීය කාර්යයකි. එසේම මෙය පෙව විවිධත්ව සම්මුතියේ අරමුණු සපුරාගැනීමේ උත්සාහයේ අනාගත ආයෝජනයකි.

මෙම වගකීම් සහිත දුෂ්කර කාර්ය සඳහා උරදුන් සැමට ස්තුති කිරීම මාගේ යුතුකමක් ලෙස මා සිතමි.

විශේෂයෙන්ම 'ජීව හෝඩිය' ග්‍රන්ථය සැකසීම සඳහා මගපෙන්වමින් අමාත්‍යාංශයට නායකත්වය සපයන පරිසර හා ස්වභාවික සම්පත් ගරු අමාත්‍ය ඒ.එච්.එම්.ෆවුසි මැතිතුමා සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය බන්දුල බස්නායක මැතිතුමාට මෙම සත්කාරය වෙනුවෙන් මා ස්තුති වෙමි.

එසේම අමාත්‍යාංශයේ ලේකම් තුමන් සහ අතිරේක ලේකම්වරු සියල්ලන්ටමත් 'ජීව හෝඩිය' සැකසීමේ කටයුතු වලදී දායකත්වය ලබාදුන් අමාත්‍යාංශයේ සියලුම අධ්‍යක්ෂකවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු, සහකාර ලේකම්වරු, අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්තුමිය ඇතුලු සෙසු නිලධාරී මණ්ඩලයටද, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ අධ්‍යක්ෂ ලලිතා ෆොන්සේකා මහත්මියටත් මාගේ ස්තූතිය පුදකරමි.

'ජීව හෝඩිය' ග්‍රන්ථය සැකසීම සඳහා වනජීවී හා පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරී දුමින්ද සංජීව බාලසූරිය මහතාගේ දායකත්වය සැබවින්ම ප්‍රශංසණීයය. එසේම ජාතික මෙහෙවර සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන්ගේ එකමුතුවට 'ජීව හෝඩිය' කදිම උදාහරණයකි.

ළමා මනසට ගැළපෙන අයුරින් 'ජීව හෝඩිය' රූ සටහන් සහ අඳාළ තොරතුරු සැකසීමට උපදෙස් ලබාදුන් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් විමල් සියඹලාගොඩ මහතාටත් එහි කාර්ය මණ්ඩලයටත් අමාත්‍යාංශය වෙනුවෙන් මා ස්තූතිවන්ත වෙමි.

'ජීව හෝඩිය' මුද්‍රණය සඳහා මූල්‍ය දායකත්වය ශ්‍රී ලංකාවේ පරිසර වැඩසටහන් සඳහා වූ ආයතන ශක්තීන් වර්ධනය කිරීමේ සහ හැකියාවන් ගොඩනැගීමේ නෙදර්ලන්ත ව්‍යාපෘතිය මගින් දරන ලද අතර එය අනාගත පරිසරවේදීන් බිහිකරලීමට අද දවසේ කල වැඩදායක ආයෝජනයකි.

අවසන් වශයෙන් 'ජීව හෝඩිය' සකස්කිරීම සඳහා තම දැනුම හා ශ්‍රමය කැපකළ පෙව විවිධත්ව අංශයේ සියලුම නිලධාරී මණ්ඩලයටත් නන් අයුරින් උපකාර කළ සැමටත් මාගේ අවංක ආදර ස්තූතිය ප්‍රකාශ කරමි.

ආර්.එම්.සී.පී. උඩුගම්පල
අතිරේක ලේකම්
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

සූචිය

මවුපියන්ට සහ ගුරුභවතුන්ට.....

ජීව හෝඩියේ සඳහන් විවිධ වචනවල සරල අර්ථය මෙම සූචිය මගින් වටහාගත හැකිය. ඉතාමත් සරල සහ බහුලව එදිනෙදා යොදාගැනෙන වචනවලට අමතරව ප්‍රාථමික සිසුනට නුහුරු වචනවල තේරුම මෙහි සඳහන් වේ. අක්ෂරයට අදාළ වචනය සහ චිත්‍රය දරුවාට පැහැදිලි කිරීමට මෙම සරල සූචිය යොදාගත හැකිය.

ආ

ආර

ප්‍රමාණයෙන් කුඩා දිය පාරක් ආර ලෙස හඳුන්වයි. විශේෂයෙන් ම කඳුකර ප්‍රදේශවල කුඩා දිය උල්පත් එකට එක්වීමෙන් සෑදෙන දිය පාරවල් වලට ආර යන නම යෙදේ.

ඈ

ඈයා

සිරුර ඝනකම් කොරපොතු වැනි ව්‍යුහ වලින් වැසුණු ක්ෂීරපායී සතෙකි. 'කබල්ලෑවා' යන නමින්ද හඳුන්වයි. රාත්‍රියේදී වැඩිපුර ගැවසෙන සත්ත්වයෙක් වන අතර වේයන් කුහුඹුවන් වැනි කෘමීන් ආහාරයට ගනී. දුර්ලභ සත්ත්වයෙකි.

ඈෂ් ගස

ලෝකයේ සෞම්‍ය කලාපීය දේශගුණයක් සහිත ප්‍රදේශවල සහ තරමක් ධ්‍රැව ආසන්න ප්‍රදේශවල වැවෙන ශාකයකි.

ඉ

ඉරමුසු

ඖෂධීය පැළෑටියකි. බහුල ව වියළි කලාපයේ හමුවේ. විශේෂයෙන් ම මෙම ශාකය තම්බා සකස්කර ගන්නා පානය අතීතයේ පටන් ම ඉතාමත් ගුණදායක පානයක් ලෙස භාවිත කර ඇත.

ඊ

ඊසාන

ශ්‍රී ලංකාවේ ඊසානදිග කලාපය/ප්‍රදේශය. (පරිසර පද්ධතියක් ලෙස දැක්වීම සඳහා මෙම ප්‍රදේශය දක්වා ඇත.)

ඊතණ

තෘණ වර්ගයකි. දේශීය වෛද්‍ය ක්‍රමයේ ඖෂධීය පැළෑටියක් ලෙස යොදාගනී, ආගමික කටයුතු සඳහා යොදාගන්නා 'ලද පස් මල්' වලට ඊතණ ඇතුළත්ය.

උ

උගුඩුවා

මෙරට හමුවන ක්ෂීරපායී සතෙකි. ඇතැම් ප්‍රදේශවලදී 'කලවැද්දා' යන නමින් ද හඳුන්වයි. රාත්‍රියේදී වැඩිපුර ගැවසෙන සත්ත්වයෙකි.

ඌ

ඌරු මීයා

ප්‍රමාණයෙන් විශාල සිරුරක් සහිත මීයෙකි.

උගරල
දේශීය අල වර්ගයකි. තෙත් කලාපයේ වැඩේ. ආහාර සඳහා යොදාගනී.

එ

එමු
ඔස්ට්‍රේලියානු මහාද්වීපයේ සහ නවසීලන්තය ආශ්‍රිත ව ජීවත්වන පියාඹීමට නොහැකි පක්ෂියෙකි.

එරබදු
රතු පැහැති මල් හටගන්නා ශාකයකි. විශේෂයෙන් ම අප්‍රේල් මාසයේදී මල් හටගන්නා නිසා සිංහල අලුත් අවුරුදු උත්සවය හා බැඳී පවතී.

ඒ

ඒකාවේරිය
ශ්‍රී ලංකාවේ දී පමණක් ම දැකිය හැකි එනම්, අප රටට ආවේණික ඖෂධීය ශාකයකි.

ඒකදන්ත ඇතා
ඇතාට ස්වාභාවයෙන්ම දළ දෙකක් පවතී. එහෙත් ඉතා කලාතුරකින් එක දළයක් පිහිටන ඇතුන් ද වාර්තාවේ. එවැනි එක් දළයක් පමණක් පවතින ඇතුන් ඒකදන්ත ඇතුන් ලෙස සැලකේ.

ඔ

ඔළිඳ
වැලක ස්වරූපයෙන් වැවෙන ශාකයකි. එහි ඇතිවන කරල් තුළ බීජ හටගනී. බීජ තද රතු සහ කළු පැහැයෙන් යුක්ත ය. අතීතයේ දී බීජ 'ඔළිඳ කෙළිය' නමැති ජන ක්‍රීඩාවට යොදාගෙන ඇත. දේශීය වෛද්‍ය ක්‍රමයේ ඖෂධීය පැළෑටියක් ලෙසත්, එසේම බර මැනීම සඳහා ඒකකයක් ලෙසත් යොදාගනී.

ඔරං ඔටන්
ලොවින් වඳ වී යාමේ තර්ජනයට ලක්ව සිටින ජීවියෙකි. විශේෂයෙන් ම ආසියානු කලාපයේ බෝර්නියෝ, සුමාත්‍රා, නිකෝබා වැනි රටවල වනාන්තරවල වාසය කරයි.

ඕ

ඕලු මුවා
මුව පවුලට අයත් සාමාජිකයෙකි. මුවාට වඩා ප්‍රමාණයෙන් කුඩා ය. සිරුරේ 'තිත්' දැකිය නොහැක. දුඹුරු පැහැති රෝම දරයි. අං තට්ටුව දිගට වර්ධනය වීම සිදුනොවේ. වඳ වී යාමේ තර්ජනයට ලක් ව සිටින ජීවියෙකි.

ඕවිට
විශේෂයෙන් ගම්මානයක ගෙවතු සහ කුඹුරුයාය අතර පිහිටි විවෘත භූමි භාගයකි. මෙහි බහුල ව ඇත්තේ කුඩා පඳුරු සහ පැළෑටිය. 'හිඹුටු', 'එරමිණියා' වැනි ශාක සුලබය. අතීතයේ දර, පළා, වර්ග ආදිය සපයා ගැනීමටත් ගවයන් වැනි සතුන් බැඳ දැමීම සඳහාත් ඕවිට යොදාගෙන ඇත.

ක

කලපුව
පටු විවරයකින් රට තුළට මුහුදු ජලය පැමිණීමෙන් සැකසුණු ජලජ පරිසරයකි. මුහුදට විවෘතවන විවරය නිතරම විවෘතව පවතී, කලපුවට සම්බන්ධ වන මිරිදිය ජල ප්‍රභව නිසා කලපුවේ කිවුල් දිය පරිසරයක් නිර්මාණය වේ. ඉස්සන්, කකුළුවන් වැනි සතුන් මෙහි සුලබව ජීවත් වේ.

ග

ගඳපාන
මෙම ශාකය සමහර ප්‍රදේශවල ''හිඟුරු'' ලෙසද හඳුන්වයි. විවිධ වර්ණයේ පුෂ්ප සහිත ශාක පවතී. වර්තමානයේ මෙය ආගන්තුක ආක්‍රමණකාරී ශාකයක් ලෙස හඳුනාගෙන ඇත.

ජ

ජපන් ජබර
මිරිදිය ජලාශ, කුඹුරු, ඇළ මාර්ග ආදියේ ජලයේ පාවෙමින් වැඩෙන ආගන්තුක ආක්‍රමණකාරී ශාකයකි. දම් පැහැති පුෂ්ප දරයි. මුලින්ම විසිතුරු පැළෑටියක් ලෙස මෙම ශාකය අප රටට ගෙනැවිත් ඇත. මේවා බහුලව වර්ධනය වීම ස්වාභාවික පරිසර පද්ධති වලට අහිතකර ලෙස බලපායි.

ජගුවරයා
බළල් පවුලට අයත් සාමාජිකයෙකි. සිරුර සුවිශේෂීය පුල්ලි රටාවකින් සමන්විතය. අප්‍රිකානු කලාපයේ ජීවත්වේ. පුල්ලි ජගුවරයා සහ කළු ජගුවරයා ලෙස සත්ත්වයන් දෙදෙනකු වාර්තාවේ.

ට

කොට්ටම්බා
තෙත් කලාපයේ සහ වියළි කලාපයේ දැකිය හැකි ශාකයකි. විශේෂයෙන්ම ජලාශ ආශ්‍රිත ප්‍රදේශවල සුලබ ය. මෙය සත්ත්වන් රැසකට ආහාර සපයන ශාකයකි. සෙවණ සඳහාත් සිටුවන ශාකයකි.

ගැට පිච්ච
සුදු පැහැති එමෙන්ම සුවඳවත් පුෂ්ප දරන ශාකයකි. අලංකාරයට වවන ශාකයකි.

කොට පිඹුරා
ශ්‍රී ලංකාවට ආවේණික උරගයෙකි. සාමාන්‍ය පිඹුරාට වඩා දිගින් අඩු ය. වඳවීයාමේ තර්ජනයට ලක් ව සිටින දුර්ලභ සත්ත්වයෙකි.

ටයිගාව
ධ්‍රැව ආසන්න ප්‍රදේශවල දැකිය හැකි පරිසර පද්ධතියකි. කේතුවක ආකාරයකට වැඩෙන ශාක මෙහි සුලබය. වසරේ ශීත සෘතුවේ හිම පතිත වීම සිදුවේ. පිනි මුවන්, වෘකයන් වැනි සතුන් ගැවසෙන පරිසර පද්ධතියකි.

ඩ

ඩයිනෝසෝරස්
අතීතයේ පෘථිවියේ වාසය කළ දැවැන්ත සත්ත්ව කාණ්ඩයකි. මොවුන් දැන් පෘථිවියෙන් වඳ වී ගොස් ඇත.

සෙබඩ
මොනරාගේ ගැහැනු සත්ත්වයා ය. දිගු පිල් කළඹක් නැත.

වක්කඩ
කුඹුරක එක් ලියද්දක සිට තවත් ලියද්දකට නියර හරහා ජලය ගමන් කරවන්නේ වක්කඩ හරහා ය. පස් පිඩැල්ලකින් වක්කඩ වසාදැමිය හැකිය. එවිට ලියද්දේ ජලය රඳා පවතී.

ණ

සාරණ
පෝෂණ ගුණයෙන් ඉහළ පලා වර්ගයකි.

කණකොකා
මෙම පක්ෂියා සාමාන්‍යයෙන් වසා සිටින විට/ලැග සිටින විට පියාපත් අඳුරු පැහැයෙන් යුක්තය. ඉගිලෙනවිට පියාපත්වල සුදු පැහැය දිස්වේ. ජලය සහිත ස්ථානවල සුලබ පක්ෂියෙකි.

තණබිම
තැනිතලා ස්වාභාවයක් ගන්නා ප්‍රදේශයක් පුරා විවිධ තෘණ වර්ග වර්ධනය වීමෙන් තණබිම් ඇතිවේ. සත්ත්ව පාලනයේ දී ඉතාමත් වැදගත් තණබිම් රැසක් යුරෝපා සහ උතුරු ඇමෙරිකා මහාද්වීපවල පිහිටා තිබේ. ගවයන් වැනි සතුන්ට ආහාර ලබා ගැනීමටද වැදගත් තැනකි.

ද

දණ්ඩියා
රට පුරාම පාහේ හමුවන කුඩා මිරිදිය මත්ස්‍යයෙකි.

න

නමිනං
තෙත් කලාපයේ ගෙවතුවල දැකියහැකි තරමක් ඇඹුල් රසයෙන් යුක්ත පලතුරකි. ඵලය ගසේ කඳේ හටගනී.

ප

පතොක්
වියළි කලාපයේ සහ වෙරළ ආශ්‍රිතව කටුක පරිසර තත්ත්ව හමුවේ පවා හොඳින් වැඩෙන ශාකයකි. බොහෝවිට ශාක දේහයේ කටු පිහිටා ඇත. සමහර අවස්ථාවල දී ගල් පර්වත ආශ්‍රිතව ද දැකිය හැකිය.

දූපත
සෑම දිශාවකින්ම ජලයෙන් වටවූ ගොඩබිමක් දූපත ලෙස හඳුන්වයි. අපේ රටද දූපතකි.

බ

බඩවැටිය
කුඩා වන රොදක කෙළවර පිහිටි තරමක් කුඩා පඳුරු සහ පැළෑටි සහිත විවෘත බිම් තීරුව බඩවැටිය ලෙස හඳුන්වයි.

ම

මදටියා
තරමක් උසට වැඩෙන ශාකයකි. කරල් තුළ බීජ හටගනී. බීජ තද රතු පැහැතිය.

ය

යව
ධාන්‍ය වර්ගයකි. සත්ත්ව ආහාර සඳහා යොදාගනී. දුර්භික්ෂ සමයක දී ගෞතම බුදුරජාණන් වහන්සේ යව ධාන්‍යයෙන් සකස් කළ ආහාර වැළඳූ බව ද සඳහන් වේ.

කාන්තාරය
ඉතා වියළි දේශගුණික තත්වයන් සහිතය. වැලි කඳු බහුලය. වර්ෂාව ඉතාමත් අඩුය. අප්‍රිකානු කලාපයේ කාන්තාර රාශියක් හමුවේ. ඔටුවන් වැනි සතුන් සහ පතොක් වැනි ශාක දක්නට ලැබේ.

ස

සවානා බිම්
ඉලුක්, මාන වැනි තෘණ වර්ග බහුල ව වැඩෙන භූමියක තැනින් තැන තරමක් උස ගස් පවතින විට එවැනි ප්‍රදේශ සවානා බිම් ලෙස හඳුන්වයි. එම ගස්වල අතු පතර තරමක් පුළුල් ව පැතිරී ඇත. ශ්‍රී ලංකාවේ උඟව පළාතේ සවානා බිම් දැකගත හැකය. සවානා බිම් අප්‍රිකානු මහද්වීපයේ සුලබ පරිසර පද්ධතියකි. වීටා, ජිරාෆ්, සීබ්‍රා වැනි සතුන් එහිදී සුලබව දැකගත හැකිය.

සස්සඳ
ආයුර්වේද ඖෂධයක් ලෙස බහුලව යොදා ගැනෙන කුඩා පැළෑටියකි. වැලක ස්වභාවයෙන් වර්ධනයවේ. එලය ආචාර හයකින් සමන්විත සුවිශේෂීය හැඩයක් ගනී. වියළි එලය රතු පැහැතිය.

හ

හබන් කුකුළා
ශ්‍රී ලංකාවට ආවේණික දුර්ලභ පක්ෂියෙකි.

හන්තාන කඳුවැටිය
මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පෙව විවිධත්වයෙන් අනූන කඳුවැටියකි.

ළ

පළා පොළඟා
මෙරටට ආවේණික උරගයෙකි. ළා කොළ පැහැයෙන් යුක්තය. මධ්‍යම කඳුකරයේ වනාන්තර අශ්‍රිතව හමුවේ. මද විෂ සහිත සර්පයෙකි.

ඟ

අංකෙන්ද
ශ්‍රී ලංකාවට අවේණික ඖෂධීය පැළෑටියකි.

අං කටුස්සා
කඳුකර ප්‍රදේශවල හමුවන ශ්‍රී ලංකාවට අවේණික දුර්ලභ උරගයෙකි. සත්ත්වයාගේ නාසයේ කෙළවර අඟක ස්වරූපය ගත් ව්‍යුහයක් පිහිටීම නිසා මෙම නම යෙදී ඇත.

අංගනය
නිවසක හෝ ගොඩනැගිල්ලක යාබද ගෙමිදුල අංගනය ලෙස හඳුන්වයි.

ඳ

රසකිඳ
වැලක ස්වභාවයෙන් වැවෙන ඖෂධීය ශාකයකි.

ඬ

එඬරු
මීටරයක් තරම් උසට වැඩෙන ශාකයකි. ශාකයේ විවිධ කොටස් දේශීය වෛද්‍ය ක්‍රමයේදී යොදාගනී. අතීතයේ ග්‍රාමීය ප්‍රදේශවල නිවාසවල ගෙවත්තේ වැට ආවරණය සඳහා එඬරු ශාක වවන ලදී.

ජීව හෝඩිය



අ ආ ඇ ඈ ඉ ඊ
උ ඌ එ ඒ ඔ ඕ
ක ග ජ ට ඩ ණ
ත ද න ප බ ම
ය ර ල ව
ස හ ළ අං
ඟ ඳ ඬ ඹ

අ





අම්මා

අලියා





අරලිය

අහස







ආ

ආදා



ආනමාළු





ආර

ඇ





ඇතා



ඇටිකුකුළා



ඇඹරුල්ලා



ඇල්ල



අඳ



අඳයා



අඳ් ගස

LIBRARY



අඳන

ඉ





ඉබ්බා

ඉරමුසු





ඉත්තෑවා

ඉවුර



්ං



්ර



්ත

්ස





උ



උගුඩුවා





උකුස්සා



උක්ගස්



උයන

දෙ



දෙරා



දෙරල



දෙරුමීයා



දෙරුකොටුව





එ





එළුවා

එමු





එරබදු



එළවළු කොටුව

ළ





ඒකාවේරිය



ඒකදන්ත ඇතා



ඒදුණ්ඩ

ධ





ධවුවා

ධළිඳ





ධරංධටං



ධය



ඵ

ඵලු





ඵලුමුවා



ඵවිට

කා





කජු

කපුටා





කරවිල



කලපුව

ග



ගස්ලබු





ගවයා



ගඳපාන



ගල්නලාව

ජ





ජම්බු





ජගුවරයා



ජපන්ජබර



ජලාශය



ට



කොට්ටම්බා



ගැට්පිච්ච



කොට්පිඹුරා



ටයිගාව

ඩ





ඩයිනෝසෝරස්

සෙබඩ





කඩල

වක්කඩ



ණ



ඌණ



කණකොකා



සාරණ



පොකුණ



ත



තල්මසා



තලගොයා



තක්කාලි



තණබිම



ද





දළඹුවා



දං



දණ්ඩියා



කන්ද

න





නයා

නමිනං





නරියා



නගරය

ප



පරෙවියා





පතොක්



පත්තෑයා





දූපත

ඛ





ඛල්ලා



ඛණ්ඩක්කා

ඛස්සා





ඛඩවැටිය

ම



මයිනා





මදටියා

මදුරුවා





මඩවගුර

යා





යව

යටිකුරිත්තා



යකිනාරං





කාන්තාරය



ර



රඹුටං



රත්කෑරලා



රත්මල්



කුඹුර

ල





ලබු



ලබුගිරවා



අල



ලන්දු



ව



වවුලා



වට්ටක්කා



වඳුරා

වනාන්තරය

ස





සමනලයා



සල්මල



සස්සඳු



සවානාබිම

හ



හබන්කුකුළා



හතු





හබරල



හන්නාන කඳු වැටිය

ළ



එළදෙන



ඇහැළු මල්



පලාපොළඟා



ඇළ



අං

අං තට්ටුව





අංකෙන්ද



අංකටුස්සා



අංගනය

ග



ගග

ද



රසකිඳ

ඩ



එඩරු

ධ



අඹ



ජීව හෝඩිය



- පෙව විවිධත්ව ලේකම් කාර්යාලය,
  පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.
- වනජීවී හා පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය (WEIC)
- ශ්‍රී ලංකාවේ පරිසර වැඩසටහන් සඳහා වූ ආයතනික ශක්තීන් වර්ධනය
  කිරීමේ සහ හැකියාවන් ගොඩනැගීමේ නෙදර්ලන්ත ව්‍යාපෘතියේ අනුග්‍රහයෙනි.

ISBN 955 - 9120 - 38 - 7